# 66.

## “මේ මොහොතෙ ලෝකය තිබෙන්නෙ භයානක තැනක. එනිසා මා ඔබ සැමගෙන් උපරිම යාච්ඤාවක් බලාපොරොත්තු වෙනවා.”

**2025 අප්‍රේල් 14 මුලසුනේ දී**

“ප්‍රේමණීය මගේ දරුවෙනි, එදා මා විඳි කටුක දුක් ගාවිනාව ඔබ සැම එක්ව සිහි කරන මේ මොහොතේ මම ඔබ සැම දෙස ඉතා ආදරයෙන් බලා සිටිමි. එදා මා කුරුස පත්වීමේදී කුරුසිය මත සිටිමින් මා සිහි කළේ ඔබ සියලු දෙනාවයි, ලෝ වැසි සකල ජනතාවයි. මගේ පිපාසය සංසිඳවන්නට මා ආරාධනා කළේ ඔබ සැමටයි. මගේ පිපාසය සංසිඳවන දිය දහර ඔබයි, දරුවෙනි. මම පිපාස වෙමි කියමින් එදා මා ආරාධනා කළේ අදත් මා ආරාධනා කරන්නේ මගේ මැවීම වන මගේ ආදරණීය මනාලියටයි. මා විඳි දුක් ගාවිනාව අද බොහෝ අයට නැරඹීමක් පමණක් වෙලා. ඒක මගේ තුවාල පෑරීමක්. එනිසා මගේ පිපාසයට සැනසීම දෙන දිය දහර වී මා වෙත එන්න, දරුවෙනි. මම මාව ඔබට දෙන කල ඔබ ඔබව මට දෙන්න. අදත් මම පිපාසිතයි, දරුවෙනි. ඔබගේ ප්‍රති ප්‍රේමයේ බැල්ම මා වෙත එන තුරු මම පිපාසිතයි. ලෞකික දේ ඔබව හිර කරගෙන. ඒ බැමි කඩා ගෙන මා වෙතට එන්න, දරුවෙනි. මට ඇණ ගසන මට පහර දෙන වධකයින් වෙන්න එපා, ඔබ කිසිවෙක්. මොන තරම් ආදරණීය දෙවි කෙනෙක් ද ඔබව මෙලෙස අමතන්නේ? ඔබ සැම පසුතැවී සිත් හරවා ගෙන එන තුරු තවමත් බලා සිටින දෙවි කෙනෙක්. මා තවමත් පිපාසිතයි, දරුවෙනි. මක්නිසාද මට අවශ්‍ය කරන පිපාසය සංසිඳවන දිය දහර මට තවමත් නොලැබුන නිසා. මගේ මේ කාරුණික ආයාචනය ඔබට නොවැටහෙන ලෙස නපුර නමැති කඩතුරාව ඔබගේ දෙනෙත් වසාගෙන තිබේ නම් මගේ දිව්‍යමය රුධිරයේ බලය ලබා ගන්න, දරුවෙනි. මගේ ළය පලාගෙන වැගුරුණාවූ රුධිර බිඳුවලින් ඔබගේ දෙනෙත් පොඟවා ගන්න, ඔබේ මනසින්. එය මහත් විශ්වාසයෙන් කරමින් සුවපත් වන්න, දරුවෙනි.”

**2025 ජුනි 07 ශුද්ධාත්ම මංගල යැදුමේ දී**

(එය සිදුවූයේ නාත්තන්ඩිය මීසමේ පහළගම ශු. මහා සන්තියාගු මුනි දේවස්ථානය අසල ඉදිකළ අප සංඝයේ ශ්‍රාවකයෙක් වන ජෙරාඩ් සොයුරාගේ නව නිවසේ දී ය.)

“මා ප්‍රේමවන්ත දරුවෙනි මේ ගෘහය, මේ භූමිය, මේ සැම සියලු දේ වරප්‍රසාදයෙන් පුරවමින් මීට සුළු මොහොතකට පෙර පියාණන්ගේ වැඩම කිරීම සිදු විය. නුඹලාගේ යාච්ඤා අතරතුර ඒ මහා වරප්‍රසාද දායකයාණෝ නුඹලා අබියසට වැඩම කළහ. මා ප්‍රේමවන්ත දරුවෙනි, මේ භූමිය අනාදියේ පටන් මා විසින් තෝරාගෙන තිබෙන භූමියක් නිසා මට මෙහි යමක් ආරම්භ කරන්නට පියාණන් විසින් ආසිරි ගැන්වූ ස්ථානයක් බවට දැන් එය පත්ව ඇත.

මේ පුංචි ගම්මානය ජාති කුල ආගම් භේද නොමැතිව විවිධ ආගම් හා එකමුතුකමකින් ගොඩනැගුණු භූමියක් ලෙස හඳුන්වන්න පුළුවන්. එකම දහමකට කොටු නොවී ඒ හැම දේකටම මේ ජනතාව එකමුතු වෙලා උත්සව පවත්වනවා. දේවස්ථානයේ කරනව වගේම අනෙක් ආගමික කටයුතුවලදීත් ඒ අය සමගත් එක් වෙමින් බොහොම එකමුතුකමකින් සිටිය ගම්මානයක්, මෙය. ඒ තත්ත්වය වෙනස් වෙමින් මෙය අඳුරට යමින් තිබෙන මොහොතක පියාණන් තීරණය කළා, මේ භූමිය භාර දෙන්නට සන්තියාගුට. මේ භූමියේ ආරක්ෂකයා හැටියට ඔහුට මේ පුංචි කොටස බාර දුන්නා. කිසිවෙක් විනාශ නොවන පිණිස සවස 6.30 වෙද්දි ගමන ආරම්භ කරමින් මේ ග්‍රාමය පුරා ඔහු ගමන් කරනවා. සමහරු තම දෙනෙතින් ඒ දර්ශනය දැක තිබෙනවා. මේ ජනතාවට මේ ග්‍රාමයට මෙතැනින් ආරම්භ වෙනවා ගැඹුරු ගමනක්. ස්වර්ගීය රාජකීය ශුද්ධවූ ගමනකට මා ආරාධනා කරනවා, මේ ජනතාවට. මා ප්‍රේමවන්ත දරුවෙනි, ඒ නිසා මේ ගෘහය ප්‍රේමයේ ගෘහයයි.

මේ ගෘහයේ දොරටු ස්වර්ගයේ දොරටු විවර කරන්නාක් මෙන් සියලු දෙනාටම විවෘතව ඇත, දහම තුළින් පෝෂණය ලබන්නට. මේ ග්‍රාමයේ ජනතාව ගැන සොයමින් මේ නිවහනේ පැවැත්වෙන යැදුම් සඳහා ඔවුන්වත් සහභාගි කරගත යුතුමයි. යාච්ඥාවට ඔවුන්ටත් ආරාධනා කරන්න. හොඳ යහපත් සිතුවිලි තිබෙන ජනතාවක්. ඔවුන්ගේ අඩුපාඩුකම් තිබෙනවා ඒ අඩුපාඩුකම් තිබෙන්නේ ඔවුන් අත්දකින නැතිබැරිකම් තුළ. ඔවුන් අත්දකින විඩාව නිසා ඔවුන් සැඟවෙනවා.

මට ඕනෑ කළා ධීවර කර්මාන්තයේ යෙදුණු මා ළාබාල පුත්‍ර ජෙරාඩ්ව දහම් නවෝදය කියන කණ්ඩායමට ශ්‍රාවකයෙකු ලෙස එකතු කරන්නට. එලෙස ජෙරාඩ් පුත්‍රයා තෝරාගෙන ඔහු ද උපයෝගි කර ගනිමින් මා විශාල කාර්යයක් කරමින් සිටිනවා. ඇත්තෙන්ම ඔහු බොහොම සරල ජීවිතයක් ගත කරන පුහු අභිමානයන් නැති ලොකු දැනඋගත්කම් නැති දුගී ලෙස දිවි ගෙවූ ධීවර පුත්‍රයෙක්. එක්තරා දිනෙක ඔහු මුලසුනට පැමිණ තමා අත්දකින අසාර්ථකත්වය මා හා පැවසුවා. ජේසු, අපි මුහුදට දියඹට ගියත් එනකොට කිසිම මාළුවෙක් නැහැ. අපි අද බොහොම අසරණ වෙලා. මම දැන් මොකක්ද කරන්නේ? මම නුඹ සමග සිටිනවා. මම නුඹව ඔසවා ගෙන යනවා. මම ඔහුට එලෙස පොරොන්දු වුණා. මසුන් වේලීම දෙසට මම ඔහුව යොමු කළා. පුංචියට පටන් අරගෙන ව්‍යාපාරය කරගෙන යන්නට මම ඔහුට උපදෙස් දුන්නා. එලෙස උපදෙස් දීම තුළ ජෙරාඩ් විශ්වාසයේ පියවර තබමින් ඒ පුංචි පවුලත් සමග පියාණන්ගේ ඒ මහා වරප්‍රසාදය ලබමින් අද ඉන්න තැන බලන්න, දරුවෙනි. ----- තව බොහොම කෙටි කාලයකදී මේ දේශයට භයානක තත්ත්වයක් පැමිණෙනවා. එනිසා විශේෂයෙන් මම ඔයාලගෙන් ඉල්ලනවා, දේශය උදෙසා මහා යාච්ඥාවක්. ඔයාලගෙ සිතුවිල්ලෙන් ඇතුලාන්තයෙන්ම ස්වාමින් වහන්සේ සමග හැසිරෙන්න, දේශයේ යහපත උදෙසා. මගේ මෑණියන්ව ළං කර ගන්න. දේශය උදෙසා මැදිහත් වන්නැයි ඒ මාතෘත්වයට ආරාධනා කරන්න. මේ දේශයට මා අලුත් නායකයෙක් දී තිබෙනවා. මේ දේශය පවිත්‍ර කිරීමට අලුත් නායකත්වයක් මම ආශිර්වාද කර තිබෙනවා. එනිසා මේ විනාශ වෙමින් පවතින දේශය ආරක්ෂා කර ගන්නට රාජ්‍ය එඩේරිකත්වයට තෝරා දී තිබෙන නායකයාට එකමුතු වන්න. ඔහු වෙනුවෙන් යාච්ඥාවෙන් මොර ගසන්න. එලෙස අපි පවිත්‍ර කරමු මේ දේශය, මේ දූෂිත වූ සමාජය, මේ බිහිසුණුවූ සමාජය. ----- දෙවියන් වහන්සේගේ මෙවැනි උතුම් කාර්යයක් උදෙසා උන්වහන්සේ කාන්තාවක් තෝරා ගත්තෙ ඇයි කියල සමහරුන් විමසනවා. එය පියාණන්ගෙ කැමැත්ත නම් ඒ ගැන විමසන්නට නුඹලා කවරහුද? පියාණන්ගේ කැමැත්ත සැලැස්ම එලෙස නම් එයට ආමෙන් කියමින් ඒ චරිතය දෙස නොවෙයි බලන්න ඕනෑ, ඒ චරිතය මෙවලමක් කරගෙන එන්නා වූ පණිවුඩය කුමක්ද? එයින් මා ගතයුත්තේ කුමක්ද? මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය කොතැනද තියෙන්නේ? එලෙසයි ඔබ සිතිය යුත්තේ. ----- ඇන්තනි දැන් දෙවන ළදරු කාලයට එන්න ආසන්නයි. මම කලකට පෙර මේ තරුණ දරුවන්ට පැවසුවා, ඇන්තනි තුළ තිබෙන දේ උරාගන්න අවස්ථාව ලබා ගන්න කියල. ඔහු තුළ තිබෙනවා, ගැඹුරු දේවල් ලෝකයට දිය යුතු. පියාණන් විසින් ඔහුගේ ප්‍රඥාවට දමා තිබෙනවා, බොහෝ දේවල්. දැන් කෙමෙන් ඒ මතකයන් ඔහුගෙන් ගිලිහෙමින් තිබෙනවා.”

## 2025 ජුලි 19 -වාර්ෂික යැදුම- පහළගම නිවසේ දී

(එදින අඩ හෝරාවක පමණ යැදුමකින් පසු මම දේශනයට මුල පිරුවා. ඒ තුළ වැඩි වේලාවක් රැඳෙන්නට මට හැකි වුයේ නැහැ. මා දුටුවා උන්වහන්සේගේ ප්‍රථම දාසිය වන සුජීවා තුළට ජේසු සමිඳුන් පැමිණ ඇති බව. මා කරමින් සිටි දේශනය එතැනින්ම නැවතුනා, පැමිණි ජේසු සමිඳුන්ට අප ඇමතීමට ඉඩ දීම සඳහා. එදින උන්වහන්සේගේ ඇමතීම ද ඉතා කෙටියෙන් සිදු වුණා. එදින සිදු වීම මට නැවත මෙලෙස වචනයට නගන්න පුළුවන්. මාගේ දේශනය කෙටි වුණා. උන්වහන්සේගේ දේශනය උන්වහන්සේම කෙටි කළා. එයින් උන්වහන්සේ අපට පැවසූ දේ ඉතා වැදගත්. දැන් සාකච්ඡා දේශන නොවෙයි, යාච්ඥාවයි ඉතා අවශ්‍ය වන්නේ. කිතුනු නාමය දරන ලෝ වැසි සියල්ලන්ගෙන් උන්වහන්සේ මේ මොහොතේ ඉල්ලා සිටින්නේ යාච්ඥාවයි.)

### එදින ජේසු සමිඳුන් දුන් පණිවුඩය මෙයයි.

“මේ මොහොතෙ ලෝකය තිබෙන්නෙ භයානක තැනක. එනිසා මා ඔබ සැමගෙන් උපරිම යාච්ඥාවක් බලාපොරොත්තු වෙනවා. මේ මොහොතෙ ලොව පුරා පීඩා විඳින ජනතාව උදෙසා, නපුරු ආත්මයන්ගෙන් ජනතාවට ඇති වන පීඩා උදෙසා, ලොව පුරා මගේ සභාවට ඇති පීඩා උදෙසා යාච්ඥා කරන්න. ඔබට යාච්ඥා කරන්නට අද මොන තරම් කරුණු තිබෙනවද? ඔබ

කණ්ඩායමක් ලෙස එක්ව යාච්ඤා කරද්දි මැදිහත්කමේ මහා යාච්ඤාවක් ගොඩනගා ගන්න. එහි දී ඔබට හැකියි, අපි මේ වෙනුවෙන් යාච්ඤා කරමු කියල යම් මාතෘකාවක් යෝජනා කරන්න. සියල්ලන් එලෙස දායක වෙමින් මහා යාච්ඤාවක් ගොඩනගා ගන්නට පුළුවන්. මට මේ මොහොතෙ ඕනෙ ලෝකයෙන්ම ගොඩාක්ම යාච්ඤාවයි. යාච්ඤාව තමා දැන් ප්‍රබල වෙන්න ඕනෙ. යාච්ඤාවෙදි ඔබ මුළු ලෝක වාසි ජනතාවම ගෙනෙන්න, මගේ කුරුසියේ පා මුලට. එහි දී මගේ රුධිරයේ බලය සියල්ලන් හා බෙදා ගන්න. අද ලොව සිදුවීම් තුළ මගේ තුවාල පැරෙමින් ලේ ගලායමින් මා මහත් වේදනාවෙන් බලා සිටිනවා. මට සැනසීම දෙන්නට කැමති අය ඇත්නම් යාච්ඤාව ප්‍රබල කර ගන්න. අද ඔබ අමතන්නට මමත් වැඩි වේලාවක් ගන්නෙ නැහැ. දරුවෙනි, දැන් නැවත යාච්ඤාව ආරම්භ කරන්න.”

හින්දු ආගමේ ශ්‍රේෂ්ඨ ආචාර්යවරයෙකු වූ ස්වාමි විවේකානන්ද තුමාගේ දේශනයක් ද සාන්ත ෆ්‍රැන්සිස් සාලෙස් මුනිතුමාගේ අධ්‍යාත්මික අත්දැකීමක් ද ඔබ ඉදිරියේ තබන්නට කැමැත්තෙමි.

## භක්තිය දිවියේ උච්ච පරමාර්ථයයි.

“භක්තිය යනු පරමේශ්වරයාණන් කෙරෙහි දක්වන පරම ප්‍රේමය යි. මිනිසා පරමේශ්වරයාණන්ට ප්‍රේම කළ යුතු ද, යුතු නම් ඒ කුමක් නිසා ද යනු විසඳිය යුතු ප්‍රශ්නය. එය විසඳා වටහා ගන්නා තුරු අපට භක්තිය යනු කුමක්ද කියා යන්තමෙකින් වත් වටහා ගත නොහැකිය.

කවර රටක වැසියකු වුව ද ඔහුට ආගමක් ඇති නම්, තමා ශරීරයකුත් ආත්මයකුත් ඇති බව ඔහු දන්නා කරුණකි. කෙනෙකුගේ ජීවිතයේ ශරීරය හා ශාරීරික අවශ්‍යතා ප්‍රමුඛ වේ යැයි සිතන්න. එවැන්නකුගෙන් ඇසුවහොත් ඔහු ජීවත් වනුයේ කුමකට ද කියා ඉඳුරන් පිනවා ගන්නටත් භෝග සම්පත්තිය විඳින්නටත් තමා ජීවත් වන බව ඔහු පවසනවාට සැකයක් නැති, මරණින් මතු අනාගත ජීවිතයක් ගැන ඔහු ඇදහුව ද එය ද තමා ගත කරන ලෞකික ජීවිතයෙහිම තවත් වර්ධන අවස්ථාවකැයි ඔහු සිතයි. කවර දා මුත් මේ හැම මෙහි දමා මෙලොවින් පිටව යන බව ඔහු දනී. එසේ මෙලොවින් පිටව ගොස් පිවිසෙන තැන ද මේ සැපම කිහිප ගුණයකින් අධිකව යළි ලබන්නට ඔහු පතයි. ඔහු දෙවියන් වඳින්නේත් පුදන්නේත් මේ සැප යළි එලොවදීත් ලබා ගත හැකි වනුයේ දෙවියන් වැඳීමෙනැයි තමා සිතන හෙයිනි. ඔහුගේ ජීවිතයේ පරමාර්ථය ඉඳුරන් පිනවීමයි, ඉන්ද්‍රිය ප්‍රසංගයයි.

මිනිසා ආත්මයකි; එයට ශරීරයක් ද තිබේ. එනිසා අධ්‍යාත්මික සම්බන්ධකම් උතුම් ය යනුවෙන් පිළිගන්නා අය සිටිති. ඔහුගේ ජීවිත පරමාර්ථය දෙවියන් වෙත පිවිසීමයි. මෙහි දී ලැබෙන ඉන්ද්‍රිය ප්‍රසංගය ස්වකීය ලෞකික යාත්‍රාවේ (වන්දනා ගමනේ) එක්තරා ළඳරු අවස්ථාවක් ලෙස හේ සලකයි ඉන්ද්‍රිය ප්‍රසංගයෙහි මිනිසකු ලොල් නොවූ තරමට ඔහුගේ ජීවිත ක්‍රමය උසස් වේ. ඌරා ආහාර ගන්නා විට සිය සතුට දක්වමින් මුමුනන හැටි බලන්න. ඒ වේලාවට ඔහු ඉදිරියට දේව දූතයෙකු පැමිණුනත් හිස ඔසොවා බලන්නේ ඒ ඌරා නොවේ. ඌරාගේ මුළු ජීවිතයම කෑමටම ඇරුණෙකි. එවැනි තිරිසනුන්ගේ ඇස් කන් නාසාදි ඉන්ද්‍රියන්ගේ ශක්තිය සලකා බලන්න. උහු කාම භෝගයෙහි ඇලෙති, ගැලෙති. මිනිසකු ස්වභාවයෙන් අධම වූ තරමට ඔහු කාම භෝගය සඳහා දක්වන ගිජු බව ද අධික වේ. ඔහු ස්වභාවයෙන් උසස් වන්නට වන්නට, ඔහු තුළ භක්තියත් බුද්ධියත් වැඩේ.

ශරීරය, මනස, ආත්මය යන ත්‍රිවිධ විෂයයන් කෙරෙහි යෙදීමට එක්තරා ශක්ති ප්‍රමාණයක් මිනිසකු සතුව ඇතැයි සිතමු. ඉන් එක් විෂයයක් කෙරෙහි එම ශක්තියෙන් යම් පමණක් යෙදුව ද අනෙක් විෂය දෙක කෙරෙහි යෙදීමට එම ශක්තියෙන් එපමණක්ම අඩු වේ. ම්ලේච්ඡ ජාතිහු ශිෂ්ට ජාතින්ට වඩා බුද්ධි ප්‍රභායෙන් හීන වෙති. බුද්ධි ප්‍රභායෙන් හීන වූ තරමට කාම භෝගයෙහි ගිජු බව ද වැඩි වේ. මනුෂ්‍ය ජාතියක් ශිෂ්ඨ වන විට ඔවුන්ගේ ඉන්ද්‍රිය ශක්තිය කෙමෙන් සියුම් වේ. ආක්‍රමණයෙහි ශක්තිමත් වනුවෝ ම්ලේච්ඡයෝ මැයි. එහෙයින් මුළු ජීවිතයම ඉන්ද්‍රිය ප්‍රසංගය සඳහාම යොදවන්නට ගියහොත් ඉන් තිරිසන් ගතියට හෝ ම්ලේච්ඡත්වයට වැටෙනු නියතයි.

කාම සම්පත්තියෙන් පිරි ස්වර්ගයක් පතන මනුෂ්‍යයන් පිළිබඳව කිව හැක්කේ ද එපමණකි. ඔවුන්ට උවමනා ඉන්ද්‍රිය ප්‍රසංගය පමණකි. එය නැති වීම ඔවුන්ට ස්වර්ගය නැති වීමකි. එම තත්ත්වය තුළ කිසිවකුට සැබෑ දේව භක්තිකයන් විය නොහැකිය. එහෙත් මේ ලාමක තත්ත්වය පිළිබඳ අත්දැකීමම ඒ තත්ත්වය ගැන කළකිරීමක් ඇති වන්නට ද උසස් පරමාර්ථයක් සොයන්නට ද පෙළඹවීමක් වන්නට පුළුවන. එනිසා මෙම තත්ත්වය ද ජීවිත යාත්‍රාවේ ළදරු අවස්ථාවක් ලෙස සැලකිය හැක. තමන් කලින් නොදුටු උසස් පරමාර්ථයක් ඇත යනු අවබෝධ වන විට ජීවිතය කෙරෙහිත් ඉන්ද්‍රිය විෂයක අරමුණු කෙරෙහිත් ඇති තෘෂ්ණාව අනුක්‍රමයෙන් පිරිහී යයි.

මෙලොව කෑමත් බීමත් ප්‍රිය කරන ළදරුවන්ගෙන් පිරී ගිය තැනක් මෙනි. ඔවුන්ට මේ රස කැවිලිවලට ඉහළ දෙයක් නැති. සිහිනෙනුදු ඔවුන්ට පෙනෙනුයේ රස කැවිලි ය. පරලොව ජීවිතයේදී ද ඔවුන් පතනුයේ රස කැවිල්ලෙන් අනූන තත්ත්වයකි. ස්වර්ගය කෙබඳු විය යුතු ද යන්න ගැන අප එකිනෙකාගේ අදහස් අමුතු වේ; එය කල් යත් යත් වෙනස් වේ; වයසින් හා නුවණින් වැඩෙත් වැඩෙත් අපේ පරමාර්ථයන් ද උත්තරීතර වී අපට ටික ටික ඈත පෙනෙන්නට වේ. දේව භක්ති ප්‍රේමයෙන් පිරෙත්ම ඔහුට වඩා ඈතට පෙනේ. ඔහුට උවමනා දෙවියන් පමණකි. දෙවියන් වෙත පිවිසීමට ඉහළ ප්‍රාර්ථනයකුත් වේද? මනුෂ්‍යයාගේ සැබෑ පරමාර්ථය දෙවියන්ම පමණකි. දෙවියන් මහිමයෙහි තුටු වන්න. දෙවියන්ට ඉහළ දේවත්වයට ඉහළ කිසිවක් නැත. පරිපූර්ණත්වයෙහි මූර්තිය තමා දෙවියෝ.

ප්‍රේමයට වඩා උත්තරීතර වූ ප්‍රසංගයක් ද නැත. මෙහි ප්‍රේමය යන්නෙන් අප අදහස් කරන්නේ සාමාන්‍ය ලෞකික වූ ස්වාර්ථපර ආලය නොවේ. එයට ප්‍රේමය යන්න යෙදීම දේව අපරාධයකි. නිර්මමත්වයෙන් පරිපූර්ණ වූ ප්‍රේමය පමණකි, තථ්‍ය ප්‍රේමය. ඒ තමා දෙවියන් කෙරෙහි දැක්වෙන ප්‍රේමය. අඹු දරුවන් දෙමවුපියන් ආදීන් කෙරෙහි දැක්වෙන ප්‍රේමය ආදි නොයෙක් වර්ගයේ ප්‍රේමයන් ඉක්මවා යන ගමනෙකි, අපේ යාත්‍රාව. (අපේ වන්දනා ගමන) මනුෂ්‍යයෝ නිරන්තරයෙන් භාර්යාවන් ධනය හා කීර්තිය ලුහුබැඳ දුවති. සමහර විටෙක ඔවුන්ට තදින්ම පහර වැදේ. එවිට ඇස පෑදී ලෝ තතු නිසි ලෙස පෙනේ. හුදු මිනිස් පෙම හිස් වූ මායාවක් බව දකී. ප්‍රේමය ගැන කතා කළ පමණින් ප්‍රේම කිරීමේ ශක්තිය මිනිසාට නොලැබේ. එය දෙවිඳුන්ගෙන් ලැබිය යුත්තකි. සැබෑ දේව භක්ති ප්‍රේමයෙන් පිරුණු තැනැත්තාට එය ලැබේ.

පිටු පස සිට අප ඉදිරියට තල්ලු කරන ශක්තියක් වේ. අප සොයා යන නියම වස්තුව කොතැන දැයි අපි නොදනිමු. එහෙත් මේ ප්‍රේමය එය කෙරෙහි අප ගමන් කරවයි. නෙක වර අපට වැරදේ. යළි යළි අපේ වරද අපට පෙනී අපි හරි මඟට වැටෙමු. අපි එකෙක එල්ලෙමු. එහෙත් අප අතින් එය මොහොතින් ලිස්සා යේ. එවිට අපි අනෙකක එල්ලෙමු. එසේ අපි වැටි වැටී හෝ ඉදිරියටම යමු. අපට එළිය පෙනෙන තෙක් යමු. කෙළවර අපි දෙවියන් කරා එළඹෙමු. එතුමන්ගේ ප්‍රේමය නොවෙනස් වන්නකි. එහි අපට තැනක් ඉඳුරා තිබේ.

එහෙත් දෙවියන් වෙත අප ගෙන යන මාර්ගය ඉතා දීර්ඝය. ඉතා කටුකය. එහෙයින් එතුමන්ගේ මහා ප්‍රේම මංඩලයට පිවිසෙනුයේ එමගින් විශ්ව ආත්මයක් ඇති කර ගනුයේ ඉතා ටික දෙනෙකි. ඔවුන්ගේ සදාශ්‍රයෙන් ඔවුන් වෙසෙන රට සුඛිත වේ; පුණ්‍ය වේ. අප හැමම ඒ තත්ත්වයට පිවිසෙන්නට උත්සාහ කළ යුතුයි. එහෙත් බොහෝ දෙනා ආගම ව්‍යාපාරයක් කර ගනිති.

වඩාත් ප්‍රේම කළ යුතු වස්තූන් හමුවත්ම පූර්වයෙන් දත් වස්තූන් කෙරෙහි තිබුණු ප්‍රේමය පිරිහේ. පාසල් සමයේදී තම පංතියේ සිටින ඇතැමුන් තරම් ප්‍රේමණීය අය සිය ජීවිතයේ දී කිසි කලෙකවත් නොලැබෙතැයි බාලයෝ සිතති. සිය පියා හෝ මව තරම් ප්‍රේමණීය කෙනෙකු නැතැයි ඇතැම් දරුවෙක් සිතයි. ළදරු අවස්ථාවෙන් යොවුන් වියට පත් වූ විට ප්‍රේමණීය වනුයේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව යි. එම අදහස පහළවත්ම පැරණි පෙම් ලොව අතුරුදහන් වී යේ අලුත් පෙම ඉස්මතු වේ. එක් තරුවක් පායයි එයට ලොකු අනෙකක් පායයි; තවත් ලොකු ලොකු තරු පායයි. කෙළවර හිරු පායයි. එවිට කුඩා හෙළි සියල්ලම අතුරුදහන් වෙයි. ඒ හිරු තමා දෙවියෝ. අර තරු තමා අපේ ක්ෂුද්‍ර ප්‍රේමණීය වස්තු. හිරු පායා එහි එළිය වැටෙත්ම මිනිසා ඇමසන්ගේ වචනයෙන් දේව භක්ති ප්‍රේමයෙන් මත්වූවෙක් වෙයි. ඒ කේවල ප්‍රේම සාගරයේ සියල්ලම නිමග්න වේ.

ජීවිතයේ පර්මාර්ථය ලෞකික සුඛය යැයි සිතන්නා පිරිහේ. ඒ අදහස පවතින තුරු හේ ඉන් ඉහළට නොනඟී. ඔහුට තථ්‍ය ප්‍රේමයේ ඡායාවවත් ඈතින් හෝ නොපෙනේ. හේ සදා

ඉන්ද්‍රියයන්ගේ දාසයෙක් වේ; තමාට රස කැවිලි ලබා දෙන කාසි පණම් සඳහා නිරන්තරයෙන් වෙහෙසෙන බැලයෙක් වේ. එබඳු ජීවිතයකට වඩා මරණය යෙහෙකි. මේ ලෞකික දාසත්වයෙන්, මේ ඉන්ද්‍රිය දාසත්වයෙන් මිදෙන්නට රිසි වෙමු. මේ කාම භෝගි ජීවිතයට වඩා උත්තම තත්ත්වයක් වේ. අපට එය දවසකින් දෙකකින් ලබා ගත හැකි නොවේ. ඒ ප්‍රේමය අප තුළ ඇතැයි අපට හිතෙන්නට පුළුවනි. එහෙත් එය නිකම් සිතිවිලි මාත්‍රයකි. ඒ තවමත් ඉතා ඈතයි. අප විසින් එක් එක් මිනිසාගේ තත්ත්වය වෙන වෙනම සලකා එක් එක් අයට තත්වානුරූප පරිදි දියුණු වන්නට මඟ දැක්විය යුතුයි.

දෙවියන් ගැන නොසිතා බොහෝ දෙනා යන්ත්‍රෝපකරණ මෙන් ස්වකීය දෛනික කාර්යයන්හි යෙදෙති. කවර දා හෝ මරුවා ඇවිත් කැඳවයි, "මඳකට ඉවසන්න. මගේ පුතා තව ටිකක් වැඩෙන තෙක් මා ඉන්න ඕනෑ"යි මිනිසා මරුවාට කියයි. "වහාම එන්නැයි" මරුවා යළිත් පවසා ඔහු කැඳවා ගෙන යයි. ලෝක යාත්‍රාව එලෙසයි. එයට හේතුව කුමක්ද? ජීවත්ව සිටිද්දී දෙවියන් ප්‍රමුඛත්වය ඇති කිසිවක් ඔහුට දකින්නට ලැබුණේ නැති. ඇතැමෙක් මේ ස්වප්නයෙන් පිබිදෙති. නොපැතූ නොසිතූ විපතක් පැමිණේ. ඔහු මොර ගසයි එහෙත් එමගින් උසස් පරමාර්ථයක් කරා ඔහු පැමිණේ.

භක්තිය සැබෑ ආගමයි. එහෙත් සැබෑ ආගම ඉතා ටික දෙනෙකුට පමණක් ගෝචර වන්නකි. දණ ගැසීමේ ක්‍රම, හිඳ ගැනීමේ ක්‍රම, වැඳීමේ ක්‍රම ආදිය නම් බොහෝ දෙනාට ගෝචර වේ. භක්ති මාර්ගයේ පළමුවන පියවර දෙවියන් කෙරෙහි පිපාසා වීමයි. බාහිර ලෝකයෙන් අපේ උවමනාවන් සියල්ලම සැපයෙන හෙයින් අපට දෙවියන් හැර අන් හැම දෙයක්ම වුවමනායි. අපේ උවමනාවන් බාහිර ලෝකය ඉක්මවා ගිය තැනය, අප දෙවියන්ගෙන් කිසිවක් පතන්නේ. අපේ වුවමනාවන් මේ ද්‍රව්‍යමය විශ්වයට සීමා වී තිබෙන තාක් අපට දෙවියන්ගෙන් වුවමනාවක් නැති. මෙහි ලැබෙන දැය සපුරා විඳ ඒ හැම තිත්ත වුණාම පමණකි, අප කිසිත් ලබා ගනු සඳහා මොබින් ඈත බලන්නේ. එවිට මෙලොවින් බැහැර වූ කිසිවක් ඔබට වුවමනා වනු නියතය. අන්න එදා ඔබ ආගම මාර්ගයේ පළමු අඩියට පිවිසුණා වේ.

යමක් නැතිව අපට ජීවත් වනු බැරිද එය අප කෙසේ හෝ ලැබිය යුතුය. එසේ නොලැබුණොත් අපට ලැබෙනුයේ මරණයයි. අපට වාතය නැතිව ජීවත් වන්නට බැරිය; ඒ නිසා එය අත්‍යවශ්‍යමය. දෙවියන් පිළිබඳව ද එබඳු වුවමනාවක් එළඹෙන දිනයක් පැමිණේ. අන්න එදා අප සැබෑ භක්තිකයන් වනු ඇත. මේ අඳුරු වලාව මොහොතකට හෝ ඉවත්ව ගිය විටක ඉන් ඈත පෙනුණු විට අපේ මේ කුඩා ජීවිතයනුත් අපේ ලෞකික ආශාවනුත් මහා සාගරයේ දිය බිඳුවකට සමාන වී පෙනී යේ. එවිට ආත්මයට දෙවියන් නැතිවම බැරිවේ.

අපට උවමනා කුමක්ද යනු පළමු අඩියයි. අපට දෙවියන් වුවමනා ද? දිනපතාම මේ ප්‍රශ්නය අප අපගෙන්ම අසමු. මෙලොව ඇති තාක් පොත පත කියවා හෝ බුද්ධි මහිමයෙන් හෝ ලබා ගත හැක්කක් නොවේ, භක්තිය. යමෙකුට දෙවියන් වුවමනාද ඔහු තුළ භක්තිය ඉපදේ. ඔහු තුළ දෙවියෝ පහළ වෙති. එම අත්දැකීම සමාජය කෙරෙහි ද ගුණාත්මක බලපෑමක් ඇති කරයි. මන්ද ප්‍රේමය නිරන්තරයෙන්ම අන්‍යෝන්‍ය සම්බන්ධකයි, පරාවර්තකයි.

ආගම ගැන කතා කරන්නට සැරසෙන විට, විශේෂයෙන් අනුනට ආගම උගන්වන්නට සැරසෙන විට තමා තමාගෙන්ම එක ප්‍රශ්නයක් ඇසිය යුතුය. "මට දෙවියන් උවමනාද?" දෙවිඳුන්ට ප්‍රේම කරන්න. අපේ ජීවිතයේ පරමාර්ථය දෙවියෝම වෙති. බොහෝ විට ලෞකික සුඛය පරමාර්ථය කර ගැනීමට දෙවියන් උපකරණයක් කර ගන්නට මිනිසා පුරුදුව සිටී. "දෙවියනි මට අසුවල් දෙය ලබා දෙන්න. මගේ මේ රෝගය සුවකර මා සුඛිත කරන්න." යනාදි විසින් දෙවියන් යදින්නන් අපට දක්නට ලැබේ. ඔවුන්ට අවශ්‍යව ඇත්තේ සුඛිත වූ සුන්දරතම දේහ සම්පත්තිය යි. එය සපුරා දීමට දෙවිඳුන්ට හැකි බව ඔවුහු සිතති. එනිසා දෙවියන් පුදති. ආගම ගැන මෙවැනි අදහස් ඇතිව ජීවත් වනවාට වඩා අදේවවාදියෙක් වීම යෙහෙකි. එබැවින් භක්තිය ජීවිතයේ උච්ච පරමාර්ථය කර ගන්න. ඉන්ද්‍රියයන් ඒ පරමාර්ථයට යොමු කරන්න. අපේ ජීවිත කාලයේ දි ඒ මාර්ගයේ කෙළවරට පැමිණෙන්නට අපට නොහැකි වන්නට පුළුවන. එහෙත් භක්ති ප්‍රේමයේ සැබෑ මඟට පිවිසෙමු. රටක යම් කිසි පිරිසක් හෝ මේ මගට පිවිසෙන තරමට දේශය පුණ්‍ය වේ."

('විවේකානන්ද දේශනාවලිය', ශ්‍රී චාල්ස් ද සිල්වා සූරීන්)

## දේව භක්ති ප්‍රේමය දෙවියන් වහන්සේට ඉතා ප්‍රිය මනාපය

"දේව භක්ති ප්‍රේමය දෙවියන් වහන්සේට ඉතා ප්‍රිය මනාපය. ඊට ආශා වී උත්සාහ කළ යුතුය. සත්‍ය දේව භක්තිය නම් දෙවියන් වහන්සේ වෙත සුළු ආදරයක් නොව සම්පූර්ණ ආදරය වන්නේය. ---- දේව භක්ති ප්‍රේමයෙන් පිරුණු අය කඩිසරකමින් හා ඉහළිනුත් පහසුවෙනුත් පියාසර කරන්නෝය. යහපත් මාර්ගයේ ගමන් කරන පිණිස අපට ලැබෙන ආශාව කරණකොට ගෙන අප හෘද තුළ හට ගන්නා සතුට හා ජ්වලිත කඩිසරකම භක්ති ප්‍රේමය වන්නේය. භක්ති ප්‍රේමයට පැමිණුන ඉක්බිති සුවපත් නිරෝගි අයෙක් මෙන් දේව පණත් නමැති මාර්ගයේ ගමන් කරනවා පමණක් නොව දිව්‍ය අභිමුඛයට දුව දුව පැන පැන යයි. දෙවි වරම් ලැබුන කල්හි කඩිසර ලෙස ඉස්සරහටම පනී. ---- දේව ස්නේහය නම් ඥාන ගින්න වේ. ඒ ගින්න ගිනි මැලයක් වූ කළ දේව භක්ති ප්‍රේමය යැයි කියනු ලැබේ. දේව භක්ති ප්‍රේමය නමැති ගින්නෙන් දේව ස්නේහය නමැති ගිනි දළුව නගින විට දේව පණත් රකින්නට පමණක් නොව ණය නැති වූ ස්වර්ගීය දැනුමැතිකම් හා දිව්‍ය වරමින් ඉපදෙන ධර්මයන් රක්ෂා කරන්නට ආත්මය කඩිසරකමින් ඉදිරිපත් වේ.

පොරොන්දු දේශය හොඳ සශ්‍රිකය. එය භුක්ති විඳීම මධුරය, ප්‍රිය ප්‍රසන්නය, සියලු ජීවිත වලට වඩා භක්ති ප්‍රේම ජීවිතය මධුරය, ප්‍රියය, ප්‍රසන්නය, වාසනාවන්තය. භක්තිවන්තයෝ යැදුමෙන් නිරාහාරයෙන් ඉඳුරන් දමනය කිරීමෙන් අසීරු අමාරු ක්‍රියා ඉටු කරමින් පවතින බව ලෝක වාසිහු බලා සිටිති. එහෙත් එබඳු ක්‍රියා මධුර ලෙස සතුටින් හා පහසුවෙන් ඉටු කරන්නට හෘදය තුළ හටගැනී තිබෙන භක්ති ප්‍රේමය නිසා පහසු වන බව ඔවුන්ට නොපෙනේ. ක්ලේශයන් මැඩ පැවැත්වීමේ තිත්තය භක්තිවන්තයන්ට සම්බ වන නමුත් එවැනි තිත්තය ඔවුන් මිහිරි රසයකට හරවා ගනිති. ශුද්ධවන්තයන්ට මරණය පහසු වුණේ ඔවුන් භක්ති ප්‍රේමයෙහි ගිලී සිටි නිසාය. දේව භක්ති ප්‍රේමය නිසා රෞද්‍ර වේදනා හා මරණය මෙවන් මිහිරි රසයක් වේ නම් ධර්ම ක්‍රියා කරන්නට කොපමණ සතුටක් ඇද්ද? ක්ලේශ මර්ධනය කිරීම නමති අම්හිර මකා පැණි රස දෙන උක් සකුරු නම් භක්ති ප්‍රේමය යි. ---- භක්තිවන්තකමට දුක හා ප්‍රීතිය එක සමානව පෙනෙනු ඇත. ---- සත්‍ය දේව භක්තිය සියලු දේ සම්පූර්ණ කරනවා මිස කිසිවකට අන්තරායක් නොකරයි.

දේව කුමාරයාව සරණ කොට ගන්නට ආශා වී සිටින ප්‍රාණය පළමුවෙන් පාප ක්‍රියා නමැති පරණ මනුෂ්‍ය ස්වභාවයේ වස්ත්‍ර ගලවා හැර අලුත් ස්වභාවය නමැති අභිනව වස්ත්‍ර පළඳින්ට ඕනෑය. ඉන්පසු දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමට බාධා කරන සියලු ආකාර වැලකිම් කපා ඉවත දැමිය යුතුය. දේව භක්ති ප්‍රේමයට පැමිණෙන්නට යන ප්‍රාණය ක්ෂණයකදී නොව ටිකින් ටික ඝනාන්ධකාරය පහ කරන සූර්යෝදයට සමානව ප්‍රථම කොට පාපවලින් නිදහස් වී ක්‍රමයෙන් ධර්මයට පැමිණෙන්නේය.

('දේව භක්ති ප්‍රේමය', සාන්ත ෆ්‍රැන්සිස් සාලෙස් මුනි.)

### ඔබගේ දැන ගැනීම පිණිසයි.

'ශුද්ධාත්ම පිය සටහන්' 67 පරිච්ඡේදයේ සිට ඒ කිසිම සටහනක් මෙලෙස ඔබ වෙත එවන්නට අදහස් නොකරමු. ජේසු සමිඳුන්ගෙන් ලැබෙන අනාවරණයන් අපි විගස වෙබ් අඩවියට ඇතුල් කරමු. එය ලබාගෙන අධ්‍යයනය කරන්නට ඔබට හැකිය.

'දහම් නවෝදය' වෙබ් අඩවිය සකසා ඇත්තේ එහි සියල්ල ඉතා පහසුවෙන් බාගත කරගෙන ඒ සියල්ල පිටු වශයෙන් ලබා ගන්නට හැකි වන ආකාරයෙන්ය.

**http://dahamnavodaya.com**